විශේෂ සටහන 7

## බැංකුකරණයේ නව යුගයක් : හරිතබවින් හා ඉන් ඔබ්බට

### හඳුන්වාදීම

මූල්‍ය සේවා ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී හා අදාළ තීරණ ගැනීමේදී පාරිසරික, සමාජීය හා යහපාලන උපමානයන් ආයතනයට, ගනුදෙනුකරුවන්ට හා සමස්ථ සමාජයට දීර්ඝකාලීන ප්‍රතිලාභ හිමිවන පරිදි යොදාගැනීම තිරසාර මූල්‍යනය ලෙස පුළුල්ව අර්ථ දැක්විය හැකිය. කෙසේනමුත් තිරසාර මූල්‍යනය යනු කුමක්දැයි යන්නට ගෝලීය වශයෙන් පිළිගත් ඒකීය නිර්වචනයක් නොමැත.

හරිත මූල්‍යනය තිරසාර මූල්‍යනයේ අංගයක් වේ. හරිත මූල්‍යනය වශයෙන් පොදුවේ අදහස් කරනුයේ කාලගුණ විපර්යාස ආශ්‍රිත අභියෝග හා කාබන් විමෝචනය අඩු ආර්ථිකයක් කරා ගමන් කිරීමේදී මුහුණපාන අභියෝග ජයගැනීමට මූල්‍ය ප්‍රවාහයන් යොමු කිරීමයි. ආර්ථික සහයෝගිතාවය සහ වර්ධනය සඳහා වන සංවිධානයෙහි (OECD) නිර්වචනයට අනුව හරිත මූල්‍යනය යනු පරිසර දූෂණය හා හරිතාගාර වායු විමෝචනය අවම කර ගනිමින් මෙන්ම ස්වභාවික සම්පත් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කරමින් සහ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් ආර්ථික වර්ධනය ළඟාකර ගැනීම වේ.

අද වන විට ජනගහන වර්ධනය, පාරිසරික හායනය, කාලගුණික වෙනස්කම්, දුප්පත්කම සහ අසමානාත්මතාවය යනාදියේ බලපෑම හේතුකොට ගෙන තිරසාර මූල්‍යන පරිචයන් බැංකුකරණයේ අනාගතය බවට පත්වෙමින් පවතී. තිරසාර සංවර්ධනයේ වැදගත්කම හඳුනාගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඊට සම්බන්ධ අභියෝග වලට මුහුණ දීමට සියලු රටවල සහය ඇතිව පෘථිවිය ආරක්ෂා කිරීම හා සෞභාග්‍යය ප්‍රවර්ධනය ඉලක්ක කරගනිමින් තිරසාර සංවර්ධන ඉලක්ක හඳුන්වා දෙන ලදි.

### ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍යන ගමන්මග සහ පෙර දැක්ම

මූල්‍ය අංශයේ බොහෝ සම්බන්ධිත පාර්ශව විසින් ශ්‍රී ලංකාව තුළ තිරසාර මූල්‍යනයේ කටයුතු ඇරඹීමේ ඇති වැදගත්කම සාකච්ඡාවට බඳුන්කොට ඇත. 2016 වසරේදී නැගීගෙන එන වෙළඳපොළවල බැංකු වත්කම් වලින් 86%ක් නියෝජනය කරන අන්තර්ජාතික මූල්‍ය සංස්ථාවට (IFC) අනුබද්ධිත තිරසාර බැංකුකරණ ජාලයට (SBN) ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ වන ලදි.

2017 වසරේදී අදාළ රාජ්‍ය නියෝජිත ආයතන, බැංකු අංශය හා මූල්‍ය අංශය කෙරෙහි සම්බන්ධිත පාර්ශව සමගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තිරසාර මූල්‍යනය පරිචයන් ප්‍රවර්ධනයට හා පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා තිරසාර මූල්‍යන පෙර දැක්මක් (Road Map) ගොඩනැංවීම ආරම්භ කරන ලදි. මූල්‍ය අංශය සඳහා වන එම තිරසාර මූල්‍යන පෙර දැක්ම ගොඩනැංවීමේදී සියළු ඇල්මැති පාර්ශව ඒකරාශි කරගනිමින් පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුව තිරසාර මූල්‍යනය සඳහා වන මාර්ගෝපදේශ (Steering) කමිටුවක් පත් කරන ලදි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා ජෛව විවිධත්ව මූල්‍ය ඇරඹුම (BIOFIN) ලබාදුන් මූල්‍ය අනුග්‍රහයෙන් සහ අන්තර්ජාතික මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික සහය ලබාගනිමින් 2019 ජූනි මස, තිරසාර මූල්‍යන පෙර දැක්ම ප්‍රසිද්ධියට පත්කරන ලදි. ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපයෙන් සීමිත) (SLBA), මූල්‍යකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම සහ විනිමය හා සුරැකුම්පත් කොමිසම වැනි ඇල්මැති පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් මෙම පෙර දැක්ම සකස් කරන ලදි.

මූල්‍ය නියාමකයන් හා මූල්‍ය ආයතන අනුග්‍රහය දක්වන ව්‍යාපෘති වල පාරිසරික සමාජීය සහ යහපාලන අවදානම් කාර්යක්ෂමව කළමනාකරණය සඳහා මෙම පෙර දැක්ම පුළුල් නියාමනයන් ලබාදෙන අතරම හරිත, කාලගුණ හිතකාමී සහ සමාජීයව යහපත් ව්‍යාපාර වලට අතහිත ලබාදීම ප්‍රවර්ධනය කරයි. මෙමගින් තිරසාර මූල්‍යනයට බැංකු සහ මූල්‍ය ආයතන, ප්‍රාග්ධන වෙළඳපොල සහ රක්ෂණ ක්ෂේත්‍රය මගින් ලබාදෙන දායකත්වය ඉහළ නැංවීම මෙන්ම දැඩි ආතති තත්වයන්ට මුහුණ දිය හැකි තිරසාර හරිත ආර්ථිකයක් ගොඩනැංවීම අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා බැංකු සංගමය විසින් ශ්‍රී ලංකා තිරසාර බැංකුකරණ මුල්පිරුම (Sri Lanka Sustainable Banking Initiative) 2015 ජූලි මසදී ආරම්භ කරන ලදි. එහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනයට පහසුකම් සැපයිය හැකි වගකීම් සහගත බැංකු පරිචයන් පිළිබඳ හඳුන්වා දීම සහ ඒ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමයි. මෙහි ආරම්භයෙන් පසු තිරසාර බැංකුකරණය පිළිබඳ සූක්ෂමව හඳුනාගත් ප්‍රතිපත්ති 11ක් ශ්‍රී ලංකා තිරසාර බැංකුකරණ මුල්පිරුම මගින් එළි දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති මෙයට සහභාගි වන බැංකු වල සාමාජිකත්වයෙන් යුතු කමිටුවකින් ගොඩනංවන ලද අතර ශ්‍රී ලංකාවේ බැංකු අංශය විසින් වඩා තිරසාර දේශීය ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීමට පහසුකම් සැපයීමට තම ව්‍යාපාර කටයුතු සිදුකළ යුතු ආකාරය විස්තර කෙරේ.

තම ජාතික අවශ්‍යතා හා ප්‍රමුඛතාවන්ට ගැළපෙන පරිදි තිරසාර මූල්‍යනය ප්‍රවර්ධනය කිරීමට සෑම රටක්ම තමාට අනන්‍ය වූ ක්‍රියාමාර්ග යොදා ගනිමින් පවතී. බංගලාදේශය, බ්‍රසීලය, චීනය, ඉන්දුනීසියාව, මොරොක්කෝව, නයිජීරියාව සහ වියට්නාමය වැනි රටවල මූල්‍ය නියාමකයන් සිය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් තිරසාර මූල්‍යනය ප්‍රවර්ධනයට මූලිකත්වය ගෙන ඇත. අනෙක්

අතට ගත් කළ කොලොම්බියාව, ඉක්වදෝරය, කෙන්යාව, මෙක්සිකෝව, මොන්ගෝලියාව, දකුණු අප්‍රිකාව හා තුර්කිය වැනි රටවල බැංකු සංගම් ස්වෙච්ඡාවෙන්ම කර්මාන්ත අභිමුඛව තිරසාර සංවර්ධන ප්‍රවර්ධන ක්‍රියාමාර්ග ආරම්භ කොට ඇත. කෙසේවෙතත් ශ්‍රී ලංකා බැංකු සංගමය විසින් ශ්‍රී ලංකා තිරසාර බැංකුකරණ මුල්පිරුම ආරම්භ කිරීම හා ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධිත පාර්ශව වල සහයෝග යෙන් තිරසාර මූල්‍යන පෙර දැක්ම බිහිකිරීම හරහා ඉහත ප්‍රවේශයන් දෙකෙහි සංකලනයක් ගොඩනැගෙමින් ශ්‍රී ලංකාවට සුවිශේෂි අවස්ථාවක් හිමි වී ඇත.

මේ වන විටත් ශ්‍රී ලංකාවේ බොහෝ බලපත්‍රලාභී බැංකු තිරසාර බැංකුකරණ කටයුතු ආරම්භ කර ඇති අතර තිරසාර මූල්‍යන බැංකු ඒකක පිහිටුවා පුනර්ජනනීය බලශක්තිය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකොට ඇත. මේ වනවිට දශකයකට ආසන්න කාලයක් පුරාවට තම තිරසාරභාවය පිළිබඳව බොහෝ බලපත්‍රලාභි බැංකු සිය වාර්ෂික වාර්තා වල ගෝලීය වාර්තාකරණ මුල්පිරුම් (GRI) මාර්ගෝපදේශ යටතේ වාර්තා කරයි. තවදුරටත් ගත් කළ ශ්‍රී ලංකා බැංකු සංගමය හා බැංකු විදු පියස විසින් බැංකු අංශයේ තිරසාර මූල්‍යනය පිළිබඳ දැනුවත්භාවය සහ හැකියාවන් වර්ධනය පිළිබඳ විවිධ වැඩසටහන් දියත් කොට ඇති අතර ශ්‍රී ලංකා තිරසාර බැංකුකරණ මුල්පිරුම තිරසාර මූල්‍යනය පිළිබඳ විද්‍යුත් ඉගෙනුම් පද්ධතියක් දියත් කොට ඇත.

### බැංකු නියාමනයන් සහ තිරසාර මූල්‍යනය

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විට අදාළ සම්බන්ධිත පාර්ශවයන්ගේ සහය ඇතිව තිරසාර මූල්‍යන පෙර දැක්මෙහි ඇතුළත් ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නංවමින් සිටියි.

බොහෝ තිරසාර හා හරිත මූල්‍යන පියවරයන් විසින් හඳුනාගත් ගැටළුවක් වනුයේ තිරසාර මූල්‍යනය සඳහා පොදුවේ පිළිගත් නිර්වචනයක්, වර්ගීකරණයක් සහ තිරසාර මූල්‍යනයේ බලපෑම සැසඳිය හැකි දර්ශක හා ක්‍රියාපටිපාටීන් වල අවශ්‍යතාවයයි. තිරසාර මූල්‍යන වර්ගීකරණයක් (Taxonomy) යනු පාරිසරිකව සහ සාමාජීය වශයෙන් තිරසාර ආර්ථික කටයුතු හඳුනාගනු ලබන ලැයිස්තු ගත ක්‍රමවේදයක් වේ.

පෙර දැක්මෙහි සඳහන් පියවරයන් ක්‍රියාවට නැංවීමේදී අදාළ වන වර්ගීකරණ රාමුවක් ඇති කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අංශය තිරසාර මූල්‍යනය කිරීමට යොමු කිරීමේදී හඳුනාගෙන ඇත. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්ගීකරණ රාමුවක් ගොඩ නගමින් රටෙහි මූල්‍ය අංශයට දේශගුණික වෙනස්වීම් අවම කිරීමෙහි හා අනුවර්තනය වීමෙහිලා ප්‍රමුඛ කාර්යක් ඉටුකරන ආර්ථික ක්‍රියාකාරකම්/ අංශයන් වර්ගීකරණයට කටයුතු කරමින් සිටී.

මූල්‍ය නියාමකයන් සඳහා තිරසාර මූල්‍යනයට අදාළව පවතින නියාමක මෙවලම් කිහිපයක් පහත දැක්වේ.

- පරිසර දූෂණය ඉහළ හා අධික ලෙස කාබන් නිකුත් කරන කටයුතු සඳහා ණය ලබාදීමේ සීමා පැනවීම
- හරිත මූල්‍යන මගපෙන්වීම් හා ක්‍රියා පටිපාටි
- කාලගුණය ආශ්‍රිත ආතති පරීක්ෂණ
- කාලගුණ හා හරිත මූල්‍යන අවදානම් වලට අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා
- හරිත ණය ප්‍රතිපත්ති උපකරණ නියම කිරීම
- හරිතභාවය මත පදනම්ව වෙනස් වන සංචිත අවශ්‍යතා

ඉදිරියේදී ඇති වන වෙළඳපොල ප්‍රවණතා සහ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් තිරසාර මූල්‍යන පෙර දැක්ම ප්‍රකාරව සුදුසු උපකරණ භාවිතා කරමින් තිරසාර මූල්‍යනය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. ඒ අනුව නිසි සුපරීක්ෂණ ඇගයීම් වලට පසුව හරිත මූල්‍ය මාර්ගෝපදේශයන් හා ක්‍රියාපටිපාටි වැනි උපකරණ හඳුන්වා දීම පිළිබඳව ඉදිරියේදී සලකා බලනු ඇත.

වත්කම් වල අවදානමේ තීව්‍රතාවය තීරණය කිරීමේදී මේ වන විට ලොව පුරා නියාමකයන් වත්කම් වල හරිත බව හෝ දුඹුරු බව (Green or brown nature) ඍජුවම සැලකිල්ලට නොගනී. ඇතැම් මහ බැංකු හා නියාමකයන් තම නියාමන අපේක්ෂාවන් හා සන්නිවේදනයන් අලුත් කරගනිමින් කාලගුණය ආශ්‍රිත  අවදානම් තම නියාමන රාමුවට ඇතුළත් කොට ගෙන ඇත.

ඉදිරියේදී බැංකු වලට බාසල් ප්‍රාග්ධන රාමුවේ අදියර දෙක (Pillar 2) යටතේ සුපරීක්ෂණ නියාමන ආතති පරීක්ෂණ තත්වයන් සඳහා පාරිසරික තිරසාර හා තිරසාර නොවන කටයුතු සඳහා ණය සැපයීමේදී මූල්‍ය ස්ථායිතාවයට වන බලපෑම ඇස්තමේන්තු කිරීමේ අවස්ථාවන් ඇතුළත් කිරීමට ශක්‍යතාවය සලකා බැලිය හැකිය.

### අභියෝග

මේ වන විට ගෝලීයව ඒකීය තිරසාර මූල්‍යන වර්ගීකරණයක් ක්‍රියාත්මක නොවේ. මෙමගින් ආර්ථික, සමාජයීය හා යහපාලන උපමානයන්, තිරසාර මූල්‍යනය ඇගයීමෙහිලා යොදා ගැනීමේදී නොගැළපීම් සහගත හා සංසන්දනය කළ නොහැකි තත්වයකට මග පාදා ඇත.

තිරසාර මූල්‍යනය පිළිබඳ  ප්‍රවීණත්වය හා හැකියාවන් මද බව නියාමකයන් ඇතුළු සියළු සම්බන්ධිත පාර්ශව වලට බාධකයක් වනු ඇත. විශේෂයෙන්ම නව හරිත නිෂ්පාදන සහ තාක්ෂණයන් වේගවත්ව විකාශනය වනු ඇති අතර ඒවායේ ශක්‍යතාව තක්සේරු කිරීමට ප්‍රවීණත්වය හා පළපුරුද්ද අවශ්‍ය වනු ඇත. එම නිසා තිරසාර මූල්‍යන පියවර සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකියාවන් ඉහළ

නැංවීමේ ප්‍රයත්නයන් හා තාක්ෂණික මගපෙන්වීම වඩාත් ඉවහල් වනු ඇත.

ණය ලබා දීමේදී හා අවදානම් කළමනාකරණයේදී පදනම් කරගන්නා තිරසාර මූල්‍යන තොරතුරු වල පවත්නා අසමමිතික බව තිරසාර මූල්‍යනය ප්‍රවර්ධනයට බාධා එල්ල කළ හැකිය. කාලීන තිරසාර මූල්‍යන අවශ්‍යතා සපුරාලීමට තොරතුරු පද්ධති හා තොරතුරු ප්‍රවාහයන් දියුණු විය යුතු වේ.

අනාගතයේදී අවදානම් කළමනාකරණ රාමුවට ආර්ථික, සමාජයීය හා යහපාලනමය අවදානම් අන්තර්ගත කරමින් සමස්ථයක් ලෙස අවදානම් කළමනාකරණය කිරීමට මූල්‍ය ආයතන කටයුතු කරනු ඇතැයි අපේක්ෂිතය. ඒ අනුව සියළු සම්බන්ධිත පාර්ශවයන්ට තිරසාර මූල්‍යන පියවරයන්හි ශක්තිමත්භාවය උදෙසා ශ්‍රී ලංකාවට සුදුසු නිරවද්‍ය සංකලනයක් සොයා ගැනීම අභියෝගාත්මක වනු ඇත.

**ඉදිරි ගමන්මග**

ශ්‍රී ලංකා මහ බැංකුවේ පෙර දැක්ම මගින් තිරසාර මූල්‍යන ක්‍රියාවට නැංවීමට අදාළව උපාය මාර්ගික ක්‍රියාදාමයන් සමූහයක් නිර්ණය කෙරුනු අතර අදාළ සම්බන්ධිත පාර්ශවයන් සමග එක්ව කෙටි, මධ්‍යම හා දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැලැස්මක්ද විස්තරාත්මකව ඉදිරිපත් කරන ලදි. ශ්‍රී ලංකා මහ බැංකුව 2021 අග වන විටදී සම්බන්ධිත පාර්ශව සමග එක්ව තිරසාර මූල්‍යන වර්ගීකරණයක් නිකුත් කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ආයතන හා අනෙකුත් ආයතන විසින් තිරසාර බව පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු වාර්තා කිරීම සඳහා ආර්ථික, සමාජීය සහ යහපාලන පැතිකඩ සැලකිල්ලට ගත යුතු වේ.

කොවිඩ්19 වසංගතයත් සමග පැන නැගි ආර්ථික කම්පනය ගෝලීය ආර්ථිකය නැවත ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි. ඒ අනුව තිරසාරව ආර්ථිකයන් යළි නගා සිටුවීමට ගෝලීය ප්‍රතිපත්ති සම්පාදකයන් අවධානය යොමු කරනු ඇත. ඒ අනුව කලාප හා රටවල් අතර තිරසාර මූල්‍යන පියවරයන් උදෙසා සූදානම් සහගත බව වැඩිදියුණු කිරීම හා තහවුරු කිරීමට ඒකාබද්ධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. ඒ අනුව නව පසු වසංගත බැංකුකරණ යුගය තුළ සමාජයීය, ආර්ථික හා පරිසරාත්මක ඉලක්ක මුදුන් පමුණුවා ගනු වස් තිරසාර මූල්‍යනය අත්‍යවශ්‍ය උපකාරයක් වනු නොඅනුමානය.

---

පරිශීලක

- ශ්‍රී ලංකා තිරසාර මූල්‍යන පෙර දැක්ම (https://www.cbsl.gov.lk/en/roadmap-for-sustainable-finance-in-sri-lanka-2019)
- තිරසාර බැංකුකරණ ජාලයේ වෙබ් අඩවිය (https://www.ifc.org/wps/wcm/connect/topics_ext_content/ifc_external_corporate_site/sustainability-at-ifc/company-resources/sustainable-finance/sbn)
- තිරසාර බැංකුකරණ මුල් පිරුමේ වෙබ් අඩවිය (https://sustainablebanking.lk/)